Australian Government
Services Australia

SINHALESE

# වැඩිහිටි සත්කාර සේවා පිළිබඳ තොරතුරු සහ සහාය

My Aged Care (වැඩිහිටි සත්කාර සේවාව) මගින් රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක වන වැඩිහිටි සත්කාර සේවා පිළිබඳ තොරතුරු සහ සහාය ඔබට ලබා දේ. ලබාගත හැකි සහාය මොනවාද යන්න වටහා ගැනීමට අපගේ Aged Care Specialist Officers (ACSOs) ඔබට උදව් කළ හැකිය.

## ACSOකෙනෙකු කරන්නේ කුමක්ද?

ඔවුන්ට ඔබට මේ ආකාරයෙන් උදව් කළ හැකිය:

- විවිධ වර්ගයේ වැඩිහිටි සත්කාර සේවා, ඒ සඳහා වැය වන මුදල් සහ ආධාර ලබා ගැනීම ආරම්භ කරන ආකාරය පිළිබඳ තොරතුරු සැපයීම
- වැඩිහිටි සත්කාර ඇගයීමක් සඳහා ඔබව ඇගයීම් ආයතනයක් වෙත යොමු කිරීම
- My Aged Care (වැඩිහිටි සත්කාර සේවාව)සම්බන්ධ කටයුතු සඳහා ඔබට සහාය වීමට ලියාපදිංචි ආධාරකරුවෙකු පත් කර ගැනීම
- ප්‍රාදේශීය ආධාරක සේවා සමඟ ඔබව සම්බන්ධ කිරීම.

## ACSOකෙනෙකු සමඟ ඔබට කතා කළ හැක්කේ කෙසේද?

අපගේ සමහර සේවා මධ්‍යස්ථානවලදී හෝ ඔබේ පරිගණකය හෝ ජංගම උපාංගය හරහා වීඩියෝ කතාබහක් මගින් ඔබට ACSO නිලධාරියෙකු සමඟ කතා කළ හැකිය.

පහත ක්‍රම මගින් ඔබට ACSO සමඟ නොමිලේ හමුවීමක් වෙන්කරවා ගත හැක:

- ඔබේ භාෂාවෙන් අප සමඟ කතා කිරීමට **131 202**අංකය අමතන්න.
- ඔබේ ප්‍රදේශයේ පිහිටි Services Australia සේවා මධ්‍යස්ථානයෙන් විමසීමෙන්.

ඔබ අපව ඇමතීමේදී හෝ අප හමුවීමට පැමිණීමේදී පරිවර්තකයෙකු අවශ්‍ය නම්, අපි නොමිලේ එවැනි අයෙකු සපයන්නෙමු.

## වැඩි විස්තර සඳහා

My Aged Care සහ ACSO පිළිබඳ වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා ඔබට පහත දෑ කළ හැකිය:

- **myagedcare.gov.au** වෙත යන්න
- **servicesaustralia.gov.au/myagedcarefacetoface** වෙත යන්න
- සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා කාලය තුළ **1800 227 475** යන අංකය ඔස්සේ Services Australia හි වැඩිහිටි සත්කාර දුරකථන සේවාව අමතන්න.

# වියාචනය

මෙම ප්‍රකාශනයේ අඩංගු තොරතුරු ගෙවීම් සහ සේවාවන් සඳහා මාර්ගෝපදේශයක් ලෙස පමණක් අදහස් කෙරේ. ඔබ ගෙවීමක් සඳහා අයදුම් කිරීමට කැමතිද යන්න තීරණය කිරීම සහ ඔබගේ විශේෂිත තත්වයන් සම්බන්ධයෙන් අයදුම්පතක් ඉදිරිපත් කිරීම ඔබගේ වගකීමකි.

Australian Government
Services Australia

ENGLISH

# Information and help about aged care services

My Aged Care gives you information and help about government-funded aged care services. Our Aged Care Specialist Officers (ACSOs) can help you understand what support is available.

## What does an ACSO do

They can help you by:

- giving information about different types of aged care services, costs and how to start getting help
- referring you to an assessment organisation for an aged care assessment
- setting up a registered supporter to help you deal with My Aged Care
- connecting you to local support services.

## How you can speak with an ACSO

You can speak with an ACSO at some of our service centres or through video chat on your computer or mobile device.

You can book a free appointment with an ACSO by:

- calling **131 202** to speak with us in your language
- asking at your local Services Australia service centre.

If you need an interpreter when you call or visit us, we will provide one for free.

## For more information

To find out more about My Aged Care and ACSOs, you can:

- go to **myagedcare.gov.au**
- go to **servicesaustralia.gov.au/myagedcarefacetoface**
- call Services Australia aged care line on **1800 227 475** between Monday to Friday 8 am to 5 pm.

## Disclaimer

The information contained in this publication is intended only as a guide to payments and services. It’s your responsibility to decide if you wish to apply for a payment and to make an application with regard to your particular circumstances.